**ශීර්ෂය 407 - පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

සමාලෝචිත වර්ෂය තුල ස්ථාපිත කරන ලද නව අමාත්‍යාංශයක් වූ බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

## 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

--------------------------

**දේපළ පිරියත හා උපකරණ**

----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයේ මූල්‍ය නොවන වත්කම් ශේෂ හා අමාත්‍යාංශයේ ශේෂ අතර රු.292,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | පවතින වෙනස්කම් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | වෙනස්කම් සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 1.6.2 තැන්පතු

------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව පොදු තැන්පත් ගිණුමේ හර ශේෂය රු.4,497,317 ක් වුවද අමාත්‍යාංශ පොත් අනුව එම ශේෂය රු.4,781,575 ක් වූයෙන් රු.284,258 ක් වැඩියෙන් අමාත්‍යාංශ පොත්වල දක්වා තිබුණි. | 2020 දෙසැම්බර් මාසය තුල රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු රු.284,258 ක මුදල තැන්පත් ලෙජරයේ ගෙවීමක් ලෙස සටහන් වුවද, ප්‍රමාණවත් අක්මුදල් නොමැති නිසා එම මුදල් එම වර්ෂය තුල ගෙවීමට නොහැකි වී ඇත. එම ගෙවීම 2021 ජනවාරි මාසය තුල ගෙවීම නිසා දෙපාර්තමේන්තු ලෙජරයේ තැන්පත් ගෙවීමේ හර රු.284,258 ක් වැඩියෙන් පෙන්නුම් කරයි. 2020 වර්ෂය තුල ගෙවීමට නොහැකි වූ එම මුදල 2021 වර්ෂයේ ලෙජරයේ සටහන් කර තැන්පත් ලෙජරය නිවැරදි කර ඇත. | තැන්පත් ගිණුම් ශේෂ සමඟ භාණ්ඩාගාර පොත්වල ශේෂ සැසඳිය යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ප්‍රතිපාදන ඉතිරිවීම්** | | |
| (අ) මුළු ප්‍රතිපාදනයම ඉතිරිවීම<br>පුනරාවර්තන වැය විෂයයන් 03 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක රු.1,445,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ගරු අමාත්‍යතුමා හා කාර්ය මණ්ඩලය විදේශීය සංචාර සිදු නොකල නිසාත්, ගරු අමාත්‍යතුමා වර්ෂ අවසානයෙහි රාජකාරි භාරගත් බැවින් ඇතැම් වියදම් දැරීමේ අවශ්‍යතාවයක් පැන නොනැඟුනු නිසාත්, රජය විසින් වාහන මිලදී ගැනීම සීමා කර තිබූ නිසාත්,සහ වියදම් දැරීමට ඉල්ලුම් නොකරන ලද ඇතැම් වැය විෂයයන් සඳහා භාණ්ඩාගාරය ප්‍රතිපාදන ලබා දී තිබූ නිසාත්, යන කරුණු නිසා පුනරාවර්ථන වැය විෂයයන් 03ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක එකතුව ලෙස රු.1,445,000 ක් වු මුළු ශුද්ධ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු සකස් කළ යුතුය. |
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 11 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.3,568,782 ක් වූ අතර එය සියයට 30.4 සිට සියයට 97.37 අතර පරාසයක විය. | 2020 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කාර්යාලය බොහෝ දිනගණනක් වසා තිබූ නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | -එම- |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(ඇ) ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 05 ක ඉතිරිය ඉක්මවා රු.16,095,305 ක බැරකම්වලට එළඹ තිබුණි. | 2020 වර්ෂයේදී වරින් වර පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන් කිරීමේදී ඇතැම් වැය විෂයයන්ට අතිරික්ත වන ලෙසත්, ඇතැම් වැය විෂයයන්ට ඌන වන ලෙසත්, ප්‍රතිපාදන වෙන්කර තිබූ නිසා මෙම තත්ත්වය උද්ගත විය.<br>විගණන විමසුමේ පෙන්වා දී ඇති ඉතිරිය ඉක්මවා බැරකම් වලට එළඹ රු.16,095,304 ක මුළු වටිනාකමින් සියයට 97 ක් එනම් රු.15,612,244 ක් හදබිම අධිකාරියේ 407-2-3-1503 වැය විෂයයට අදාළ වේ. 2020 වර්ෂයේදී එම අධිකාරියේ වියදම් වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් වී නොතිබූ නිසා මෙවැනි තත්වයක් උද්ගත විය. 2021 වර්ෂයේදී මේ සඳහා ප්‍රමාණවත් අතිරේක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන එම බැරකම් නිරවුල් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කළ, සේවය අතහැර ගිය, වෙනත් යන බාණ්ඩ යටතේ වර්ෂයකට වැඩිකාලයක සිට අයවිය යුතු ණය ශේෂ වල එකතුව රු.540,667ක් විය. | (i) වැඩ තහනම් කළ අය වෙත අමාත්‍යාංශය විසින් යවනු ලබන ලිපි භාර නොගැනීම නිසා පදිංචිය තහවුරු කරන ලෙස දන්වමින් මැද කොළඹ ප්‍රාදේශීය ලේකම් හා මැතිවරණ කොමසාරිස් වෙත ලිපි මගින් දැනුම් දී ඇති අතර මෙම ණය මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කරන බව. | ආයතන සංග්‍රහයේ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර ණය අයකර ගැනීමටත් ණය ශේෂ අළුතින් එකතු කර නොගැනීමටත් වගබලා ගත යුතු වීම. |

(ii) විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සිහිකැඳවීම් යවා ඇත. සේවය හැර ගොස් ඇති එක් නිලධාරියකුගේ ණය අයකර ගැනීම සම්බන්ධව ලිපි භාර නොගන්නා තවත් නිලධාරියකුගේ පදිංචිය තහවුරු කරන ලෙස මොරටුව ප්‍රාදේශීය ලේකම් විසින් මැතිවරණ කොමසාරිස් වෙත දැනුම් දී ඇති අතර මෙම ණය මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කරන බව දන්වමි.

(iii) වෙනත් බාණ්ඩවලට අදාල එක් නිලධාරියෙකුගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් ගිණුම් සාරාංශ හරහා ණය මුදල නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන අතර තවත් නිලධාරියෙකුගේ ණය වාරික වශයෙන් ගෙවීම් කරගෙන යනු ලබයි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| අමාත්‍යාංශයකට ස්ථාන මාරු වී ගිය අතිරේක ලේකම්වරයෙකු වෙත නිකුත් කර තිබූ රු.106,990 ක් වටිනා ටැබ් පරිගණකය එම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු නොකර ඌනතාවයක් ලෙස හාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ දක්වා තිබුණි. | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට ස්ථාන මාරු වී ගිය අතිරේක ලේකම් වෙත නිකුත් කර තිබූ පරිගනක උපාංග අතරින් ලැප්ටොප් පරිගනකය හා (pen Drive ) මේ වනවිට නිසි පරිදි භාර දී ඇත. ටැබ් පරිගනකය භාර දෙන ලෙස එම නිලධාරිනියට දැනුම් දී ඇත. | ස්ථාන මාරුවීම්වලදී නිලධාරීන් භාරයේ පවතින හාණ්ඩ ආපසු ලබාගැනීමට විධිමත් ක්‍රමවේදයක් පවත්වා ගත යුතු වේ. |

**3.2** **පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018, 2019 හා 2020 වර්ෂවලට අදාල වාහන 04 ට අයත් රු.110,094 ක අලාභ සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අයකර නොගෙන මූල්‍ය ප්‍රකාශන වල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ අය විය යුතු ලෙස දක්වා තිබුණි. | මෙම අලාභ අයකර ගෙන තිබුණද, මූ.රෙ 109 මඟින් කපා හැරීමක් මෙතෙක් සිදු කර නොමැති බැවින් තවදුරටත් අයකර ගැනීමට / කපා හැරීමට / අත් හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශයේ සටහන් කර ඇත. PG – 9885 අංක දරණ වාහනයේ අලාභය 2021/04/07 දිනැතිව පොත්වලින් කපා හැර ඇති බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි දත්ත ඇතුළත් කළ යුතු වේ. |
| (ආ) | තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය අනුව රු.464,097 ක ගබඩා තොග හානියක් හා රු.2,569,008 ක වාහන අනතුරු අලාභ 17 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම වටිනාකම සමස්ථ ගබඩා තොග හානියෙන් 50% ක් වන අතර ඉතිරි 50% අලාභයට වගකිවයුතු ලෙස හඳුනාගෙන ඇති නිලධාරීන් වෙතින් අයකර ගැනීමට කටයුතු කර ඇත. මේ වනවිට මෙම නිලධාරීන් විශ්‍රාම ලබා ඇති අතර එක් නිලධාරියකු වෙතින් මේ වනවිට සම්පූර්ණයෙන් අයකිරීම් සිදුකර ඇත. අනෙක් නිලධාරීන් දෙදෙනාගෙන් අයකිරීම් සම්බන්ධව එම නිලධාරීන් විශ්‍රාම වැටුප් ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් විමසීම් සිදු කර ඇති අතර එම තොරතුරු ලැබීමෙන් අනතුරුව මෙම අලාභය කපා හැරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට නියමිතය.<br><br>මේ අතුරින් KY -5534, NB – 3015 හා PG - 9885 අංක සඳහන් වාහන අනතුරු වල අලාභ 2021.04.06 දිනැතිව කපා හැරීම් සිදු කර ඇත. ඉතිරි වාහන අනතුරු සම්බන්ධයෙන් මූ.රෙ අවසන් පරීක්ෂණ වාර්තා නිකුත් වීමෙන් පසුව මෙම වර්ෂය තුළදී එම කපා හැරීම් සිදු කර අවසන් කිරීමට කටයුතු කරන බව දන්වමි. | පාඩු සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දින වන විට අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති අතර ද්විතීයික ගණයේ රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු 03 ක අතිරික්තයක් වාර්තාවී තිබුණි. | අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතී. මෙම පුරප්පාඩුව පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මෙතෙක් කටයුතු කර නොමැත.<br>රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශලේකම්ගේ 2020.08.05 දිනැති ස්ථාන මාරු නියෝගය අනුව අමාත්‍යාංශයේ පරිපාලන නිලධාරී අනුප්‍රාප්තිකයකු රහිතව වහාම ක්‍රියාත්මක වන පරිදි ජනාධිපති කාර්යාලය වෙත සේවයෙන් මුදා හැරීමට සිදුවීම හේතුවෙන් එම තනතුර පුරප්පාඩුව පවතී .<br>භාෂා පරිවර්ථන සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැණුම් දී ඇතත් මෙතෙක් එම පුරප්පාඩුව සම්පූර්ණ කර නොමැත. | අනුමත සංඛ්‍යාව තුළ බඳවා ගැනීමට හෝ අනුමත සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වේ. |